# 23

# උම්මහාතුල් මුඃමිනීන්වරු හඳුනාගනිමු

''නබි (සල්) තුමාගේ බිරිඳ වරුන් මුඃමින්වරුන් ගේ මව්වරු වේ'' යනුවෙන් අල්කුර්ආනය පවසන්නේ ය. උම්මහාතුල් මුඃමිනීන්' යන්නෙහි අර්ථය විශ්වාස වන්තයන් ගේ මව්වරුන් නම් වේ. සහාබාවරුන් අතරින් නබි (සල්) තුමාගේ බිරිඳන්ට මේ නම ලබාදී ඇත. පහත සඳහන් වන්නේ උම්මහාතුල් මුඃමිනීන් වන නබි (සල්) තුමාගේ බිරිඳන්ය.

1. කදීජා රලියල්ලාහු අන්හා
2. සවුදා රලියල්ලාහු අන්හා
3. ආයිෂා රලියල්ලාහු අන්හා
4. හෆ්සා රලියල්ලාහු අන්හා
5. සෙයිනබ් බින්ත් හුසෙයිමා රලියල්ලාහු අන්හා
6. උම්මු සල්මා රලියල්ලාහු අන්හා
7. උම්මු හබීබා රලියල්ලාහු අන්හා
8. ජුවෙයිරියා රලියල්ලාහු අන්හා
9. සෙයිනබ් බින්ත් ජහ්ෂ් රලියල්ලාහු අන්හා
10. සෆියියා රලියල්ලාහු අන්හා
11. මෛමුනා රලියල්ලාහු අන්හා




## කදීජා (රළි) තුමිය

නබි (සල්) තුමා ගේ ප්‍රථම බිරිඳ කදීජා (රළි) වේ. ඇය මක්කාවේ කුරෙයිෂි ගෝත්‍රයට අයත් වන්නී ය. ඇයගේ පියා කුවයිලිද් වේ.

කදීජා (රළි) තුමිය නබි (සල්) තුමා විවාහ කර ගැනීමට පෙර වෙනත් විවාහ දෙක ක් කර තිබිණි. අබුහාලා, අතීක් යන දෙදෙනා කෙනෙකුට පසු අනෙකා වශයෙන් මරණයට පත් වූහ. අනතුරුව කදීජා (රළි) තුමිය වැන්දඹුවක් ලෙස තම ජීවිතය ගත කළාය. සැමියා ගේ ව්‍යාපාරය පිළිබඳ අවධානය යොමු කළ කදීජා තුමියට වෙළඳ කටයුතු පවත්වා ගෙන යාම සඳහා විශ්වාසවන්ත කෙනෙකු අවශ්‍ය විය. 'අල් අමීන්' (විශ්වාසවන්තයා) යනුවෙන් සැමගේ ප්‍රශංසාවට ලක්වූ මුහම්මද් (සල්) තුමා වඩාත් සුදුස්සා බව දැනගත්තා ය. තම වෙළෙඳ ද්‍රව්‍ය ෂාම් (සිරියා) දේශයට රැගෙන ගොස් වෙළෙඳාම් කිරීමේ වගකීම මුහම්මද් (සල්) තුමාට පැවරුවාය. එතුමා විශ්වාසවන්තව හා සත්‍යවාදිව වෙළඳාම් කර ආකර්ශණීය ලාභ ලබා නැවත පැමිණියේ ය.

කදීජා (රළි) තුමිය යහ ගුණ සදාචාර සම්පන්නය ලස්සන රූ සපුවෙන් උසස් ගුණාංගයන්ගෙන් මෙන් ම සැමට උපකාර කිරීමේ මානසිකත්වයෙන් යුක්තවූවය.

බොහෝ කුරෙයිෂි නායකයෝ වැන්දඹුවක වු කදීජා (රළි) තුමියව විවාහ කර ගැනීමට කැමැති වූහ. නමුත් එතුමිය ඒ කිසිවකුටත් කැමැති නොවුවා. නමුත් නබි (සල්) තුමාණන්ගේ යහ ගුණාංගයන් ගෙන් ආකර්ෂණය වී එතුමාණන් විවාහ කර ගැනීමට කැමැති වූවා. පසුව විවාහය පිළිබඳ කතතිකාවක් සිදු විය. පවුල් දෙකේ එකඟතාවය මත විවාහය සිදු විය. එවිට කදීජා (රළි) තුමියගේ වයස 40 වේ.

නබි (සල්) තුමා හා කදීජා (රළි) තුමිය වසර 25ක් පමණ පවුල් දිවිය ගත කළහ. ඔවුහු දරුවන් 6 දෙනෙක් බිහි කළහි. ඉන් 4ක් ගැහැනු වන අතර 2ක් පිරිමි ය.

| | |
|---|---|
| ගැහැනු දරුවන් | සෙයිනබ් (රළි) |
| | රුකයියා (රළි) |
| | උම්මුකුල්සුම් (රළි) |
| | ෆාතිමා (රළි) |
| පිරිමි දරුවන් | කාසිම් |
| | අබ්දුල්ලා |

පිරිමි දරුවන් දෙදෙනා කුඩා වියේදීම මරණයටපත් වූහ. ෆාතිමා (රළි) හැර අනිකුත් ගැහැනු දරුවන් 3 දෙනා නබි (සල්) තුමාගේ මරණයට පෙරම මරණයට පත්වූහ.

නබි (සල්) තුමාණන්ට යහපත් බිරිඳක් ලෙසත් ලෙන්ගතු සහායිකාවක් ලෙසත් එතුමිය ජීවත් වූහ. නබි (සල්) තුමාගේ ජීවිතයේ වැදගත් අවස්ථාවල ප්‍රථම යෙ ්ජනාකරු ලෙසත් සහායකයා ලෙසත් ක්‍රියා කළා ය. ඉස්ලාමයේ වර්ධනයට තම ධන සම්පත් කැප කළා ය. නබි (සල්) තුමාණන් හිරා ගුහාවේ සිටින විට අවශ්‍ය ආහාර පාන සපයා දුන්නා ය. නබි (සල්) තුමාණන්ට වහී ලැබුණු අවස්ථාවේ බියට පත් වී තැතිගෙන නිවසට පැමිණි විට ආදරයෙන් වැළඳගෙන සැනසුම් වදන් පවසා සැනසුවා ය. නබි (සල්) තුමාට ප්‍රදානය වු දූතභාවයත් ඉස්ලාම් ධර්මයත් සැකෙන් තොරව මුලින් ම පිළිගත්තා ය.

කුරෙයිෂි කාෆිර්වරුන් නබි (සල්) තුමා හා සහාබාවරුන්ට වද වේදනා දෙද්දී සනසා උපකාර කළා ය. ෂිඃබු අබූතාලිබ් කඳුවැටියේ නබි (සල්) තුමා හා පවුලේ උදවිය රඳවා තබා වේදනා දුන් අවස්ථාවේ දී කදීජා (රළි) තුමිය ද එහි සිටියා ය.

මෙලෙස යහපත් බිරිඳක් ලෙස නබි (සල්) තුමාණන් සමග ජීවත් වී ඉස්ලාමය වෙනුවෙන් තමන්ව කැප කළ කදීජා (රළි) තුමිය නුබුව්වත් 10වන වසරේ මර ණයට පත් වූවා. එවිට එතුමියගේ වයස 65කි. එතුමිය මරණයට පත් වර්ෂය ''ආමුල් හුස්න්'' දුක් වසර යනුවෙන් අමතන ලදි. ''තාහිරා'' නැමැති විශේෂ නමක් ද සහිත කදීජා (රළි) තුමියගේ ආදර්ශයන් පිළිපැදීමට උත්සාහ කරමු.

### ආයිෂා (රළි) තුමිය

ආයිෂා (රළි) තුමිය, අබූබක්කර් සිද්දීක් (රළි) තුමාගේ බාල දියණිය වේ. ඇයගේ මව උම්මු රූමාන් වේ. නුබුව්වත් දෙවන වසරේ ඇය ඉපදුණි. අබුබක්කර් සිද්දීක් (රළි) තුමාත්, නබි (සල්) තුමාත් ගජමිතුරෝ වෙති. දෙදෙනා ම සහෝදරයන් සේ ජීවත්වූහ. අබුබක්කර් (රළි) තුමා, නබි (සල්) තුමාට ඉතාමත් ආදරය දැක්වූයේ ය. නුබුව්වත් 10වන වසරේ ෂව්වාල් මස නබි (සල්) තුමාණෝ ආයිෂා (රළි) තුමිය විවාහ කර ගත්හ. නබි (සල්) තුමාණන් විවාහ කරගත් එකම කන්‍යාව වූයේ මැය පමණි. ආයිෂා (රළි) තුමිය බිය බැතියෙන් යුක්ත වූවා. ඇය අධික වශයෙන් සවුම් සමාදන් වෙයි. දන් දීමට මුල්වෙයි. ඉහල දක්ෂතාවක් පෙන්නුම් කරයි. දැනුමෙන් හා ඥානයෙන් අගතැන්පත් මෙතුමිය කාන්තාවන් අතුරින් වැඩිම හදීස් ගණනක් දැනුම් දුන් තැනැත්තිය වේ. සහාභාවරුන්ට මතුවූ ආගමික ගැටළුවලට විසඳුම් දුන්නා ය. කාන්තාවන් සම්බන්ධ අනේක විද කරුණු නබි (සල්) තුමාගෙන් විමසා පැහැදිලි කළා ය.

''අස්සිද්දීකා'' ''හුමයිරා'' යන සුවිශේෂී නාමයන් ඇයට හිමි විය. කඩිසරබව, විරත්වය, ඉවසීම. යනාදී යහගුණයන් ඇය තුළ දක්නට ලැබිණි. පොදු කටයුතු ඉටු කිරීමට ඉතා ප්‍රිය කළාය. උහද් සටනේ දී තුවාල වූවන්ට බීමට ජලය සපයා උපකාර කළා ය. බොහෝ වහලුන් මිල දී ගෙන නිදහස ලබා දුන්නා ය.

ආයිෂා (රළි) තුමියගේ නිවසේ අධික වශයෙන් කුර්ආන් වැකි ප්‍රදානය විය. ආයිෂා (රළි) තුමියගේ නිවසේදී ම නබි (සල්) තුමාණෝ වෆාත් වූහ. මෙලෙස බොහෝ සුවිශේෂත්වයන් ගෙන් හෙබි ආයිෂා (රළි) හිජ්රි 58 දී තම 68 වන වියේ දී වෆාත් වූවාය.

අභ්‍යාස

කෙටි පිළිතුරු සපයන්න.

1. උම්මහාතුල් මුඃමිනීන් යනු කවුරුන් ද?
2. කදීජා (රළි) තුමියගේ පියාගේ නම කුමක් ද?
3. නබි (සල්) තුමා විවාහකර ගන්නා විට කදීජා (රළි) තුමියගේ වයස කීය ද?
4. කදීජා (රළි) තුමිය ඉස්ලාමයේ වර්ධනයට ඉටුකළ කාර්යයන් දෙකක් ලියන්න.
5. ආයිෂා (රළි) තුමියගේ පියා කවුද?
6. ආයිෂා (රළි) තුමියගේ සුවිශේෂී නාමයන් දෙකක් ලියන්න.
7. ආයිෂා (රළි) තුමිය ඉස්ලාමයේ වර්ධනයට ඉටුකළ කාර්යයන් දෙකක් ලියන්න.
8. ආයිෂා (රළි) වෆාත් වූ හිජ්රි වර්ෂය ලියන්න.